





**VCE Chemistry**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited
**Priyantha Liyanage 0407664546**

4 වන පිටෙන්

සිංහල අප යැයි තවදුරටත් කියන්නට යෑම, නැවත ත්‍රස්තවාදී බෙදුම්වාදයකට අනාගතයේ ඉඩ දෙන්නක් බැව් තේරුම් ගත යුතුව ඇත. දකුණේ සිංහල ඡන්ද මත උතුරේ දෙමළ ජනතාවගේ විසඳුම් තීන්දු කිරීම වීරකමක් නොව, නිවට කමකි. නම්බුකාර ලෙස වාඩි වී ඔවුන් සමගින් කතා කර ඔවුන්ගේ ප්‍රශ්න වලට උත්තර සොයන්නට තරම් ආත්ම විශ්වාසයක් සිංහල දකුණට තිබිය යුතුය.

ඒ සඳහා රාජපක්ෂ ජනාධිපති විසින්ම පිහිට වූ 2006 ජූනි සිට 2009 අප්‍රේල් දක්වා සැසි වාර 128 ක් රැස්වී පොදු එකඟත්වයකින් ඉදිරිපත් කළ, සියලූ සිංහලවාදී පක්ෂ හා කණ්ඩායම් ද වාඩි වූ සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ අවසන් විසඳුම් යෝජනාවලිය සාකච්ඡා සඳහා පදනම් ලියැවිල්ලක් ලෙස ඉතාම උචිත ලියැවිල්ලකි. එම සර්ව පාක්ෂික නියෝජිත කමිටු අවසන් වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම උතුරු පළාත් සභා මැතිවරණ තීන්දුවෙන් පසු රාජපක්ෂ ආණ්ඩුවට ඇති ඉතාම නුවණක්කාර ප්‍රවේශයය.

එහෙත් දැනටත් පෙනෙන්නට ඇති හැටියට, ආණ්ඩුව ගණන් හදන්නේ එලෙසින් නොවේ. තවමත් ආණ්ඩුවේ උත්සාහය ඇත්තේ සිංහල ඡන්දවලට කතා කර, අනන්ත කාලයක් බලයේ රැඳී සිටීමටය. එය පහසුවෙන් කර ගත හැකි යැයි ඇතැමෙකු සිතන්නේ රනිල්ගේ යූ.ඇන්.පී. ය වටයෙන් වටය බිඳ වැටෙන සැටි බලා හිඳය. එහෙත් එහි අනෙක් තේරුම් නම්, මේ ආණ්ඩුවට රටේ ප්‍රශ්න විසඳීමට බුද්ධිමත් ප්‍රායෝගික හැකියාවක් හා වුවමනාවක් නැත යන්නයි. දකුණේ සිංහල ජනයාටද රටක් ගැන, අනාගත දියුණුවක් ගැන අදහසක් නොමැති හෙයි-න්, දෙමළ ජාතික සන්ධානයට තම ජනතාවගේ අනාගතය ගැන ගනු දෙනු කරන්නට සිදුවන්නේ හෙටක් ගැන හිතන්නට තරම් බුද්ධියක් නැති දකුණේ බහුතරයක් සමගින්ය. උතුරු පළාත් සභාවේ ඉරණම ද ඔවුහු එළෙසින්ම තීන්දු කරන්නට හැකි යැයි සිතති. දෙමළ ජනතාව එය එසේ බාර නොගැනීම ආණ්ඩුවට ඇති ගැටලූවය.

